00030

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන -3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**ESD1230/EPD3530 -** ළමා සංවර්ධනය 1

කාලය - පැය තුනයි. (03)

දිනය - 2023.06.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

පළමුවන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## පළමු වන කොටස

01. පෙරපාසල් ගුරුවරියක් ළමා සංවර්ධනය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ වැදගත්කම කරුණු පහක් (05) ඉදිරිපත් කරමින් තහවුරු කරන්න.

02. රූසෝ පෙන්වා දෙන පුද්ගලයෙකුගේ සංවර්ධන අවස්ථා පහ (05) නම් කරන්න.

03. අවිදූර සංවර්ධන කලාපය යන්න ඔබේ වචනවලින් පැහැදිලි කරන්න.

04. "පරිණතිය" සහ "ඉගෙනුම" අතර සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න.

05. ස්මෘති ප්‍රභේද නම් කර ස්මෘතිය දියුණු කරන සාධක දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. අවධානය යන්න නිර්වචනයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

07. ස්වයං සම්මානනය සහ ස්ව සංකල්පය යන්න වෙන වෙන ම පැහැදිලි කරන්න.

08. ළමයින්ගේ භාෂා සංවර්ධනය පිළිබඳ ව ඔබ දන්නා න්‍යායාත්මක අදහස් තුනක් (03) ඉදිරිපත් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. (i) ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දරුවන්ගේ භාෂාව සංවර්ධනය කිරීමේ දී ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පළමුවන ශ්‍රේණියේ දරුවන් සඳහා සවන්දීම හා කතා කිරීම යන භාෂා හැකියා සංවර්ධනය කිරීමට උචිත ක්‍රියාකාරකම් දෙක **(02)** බැගින් විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) පියාජේගේ න්‍යායට අනුව අවුරුදු 2 – 7 අවධියේ ළමයින්ගේ චින්තන ස්වභාවය ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයෙකු වශයෙන් එම චින්තන ස්වභාවයට අනුව ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් වෙතින් ප්‍රදර්ශනය වන අවධානය පිළිබඳ දුෂ්කරතා පහක් **(05)** ලියන්න. (ලකුණු 05)

(ii) එම දුෂ්කරතා දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) සිසුන්ගේ අවධානයෙන් යුතුව කටයුතු කිරීමේ කුසලතාව දියුණු කිරීම සඳහා ගුරුවරයෙකුට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් **(02)** විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යායේ ප්‍රධාන ක්ෂේත්‍ර ලියා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ඵලදායී ගුරුවරයෙකු ලෙස පෙර පාසල් පන්තිකාමරය තුළ එම බහුවිධ බුද්ධි න්‍යායේ මූලධර්ම භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) පූර්ණ සංවර්ධනය යන්න විවිධ සංවර්ධන අංශ අනුව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ගුරුවරියක වශයෙන් ඔබ ළමයින්ගේ චිත්තවේග සංවර්ධනය සඳහා ළමා කතන්දර භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.